*සැ. යු.* — 2014.05.30 දින පළ වූ අංක 1,865 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,866 - 2014 ජූනි මස 06 වැනි සිකුරාදා - 2014.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 742 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 758 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූනි මස 27 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූනි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 1. | රියදුරු III පන්තිය | 03 | 06/2006 IV - PL3 2006 A රු. 12,470 - -130 x 10-145x 10 - 160 x 10 - 170 x 12 - රු.18,860 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම (වෛකල්පිත විෂය හැර);<br>හා<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍ර (මෝටර් කෝච් -බර වාහන රියදුරු බලපත්‍රය);<br>හෝ<br>C - ලොරි<br>C1 - බහු කාර්ය වාහන<br>D - බස්<br>D1 - වෑන්<br>G - ට්‍රැක්ටර්<br>පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම;<br>හා<br>ට්‍රැක්ටර් පැදවීමේ පළපුරුද්ද පිළිබඳ සහතික ලබා ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ ;<br>හා<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.);<br>හා<br>සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුවීම;<br>හා<br>අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතු ය. |
| 2. | ජල කම්කරු III පන්තිය | 02 | 06/2006 IV - PL1 -2006 A රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (වෛකල්පිත විෂය හැර) |
| 3. | කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 | 06/2006 IVPLI- 2006A රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (වෛකල්පිත විෂය හැර) |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03ක කාලයක් පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අයකු විය යුතුය. (පදිංචි සහතික ඉදිරිපත් කළ යුතු ය.)
3. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය.
4. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
5. බඳවා ගැනීමේ පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
6. රියදුරු තනතුරු සඳහා කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතු ය.
7. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය පාතදුම්බර සභාවේ ලේකම් හා ප්‍රාදේශීය සභාව සතුවේ.
8. දැනටමත් පළාත් රාජ්‍ය සේවය යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.
6. පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කර ඇති සහ සේවය කරනු ලබන මූලික සුදුසුකම් සපුරාලන අය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියාකළ යුතුයි.
5. බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මධ්‍යම පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලටද මධ්‍යම පළාත් සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
6. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්‍ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 8.27"x11.69" (A4) පරිමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2014.06.20 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, පාතදුම්බර ප්‍රාදේශීය සභාව, පිටියේගෙදර, වත්තේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික පිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය,
2. ජාතික හැඳුනුම්පත,
3. අධ්‍යාපන සහතික,
4. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
5. වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික,
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
7. මෑතක දී ලබාගත් චරිත සහතිකයක්.

ලේකම්,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 19 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***පාතදුම්බර ප්‍රාදේශීය සභාව***

.............................................................................. *තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :——————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.

2. ස්ථිර ලිපිනය :——————————.

3. උපන් දිනය අවුරුද්ද :——————————, මාසය :——————————., දිනය:——————————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු :——————————, මාස :——————————, දින:——————————.

5. විවාහක/අවිවාහක බව :——————————.

6. ජාතිය:——————————.

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? :——————————.
   එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචිවීමෙන් ද ? යන වග :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :——————————.
   අ.පො.ස. (සා.පෙළ) විභාගය
   සමත් වර්ෂය:——————————. විභාග අංකය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

9. (1) වෙනත් සුදුසුකම් :——————————.

   (2) වෘත්තීය සුදුසුකම් :——————————.

   (3) සේවා පළපුරුද්ද :——————————.

   (4) සියළුම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය. :——————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————.

    මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................. මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ........................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන ස්ථිර සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක.

________________________ .
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :________________________ .
පදවිය :________________________ .
දිනය :________________________ .

---

06-62

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක සේවකයින් ගැන වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

***උපලේඛනය***

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණ* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | ඝන අපද්‍රව්‍ය කළමනාකරරණ මධ්‍යස්ථාන භාරකරු (III ශ්‍රේණිය) | 01 | (MN1-2006A) රු.13,120 - 10 x 145 - 11 x 170 -10 x 240 10 x 320 - රු.22,040 | අ.පො.ස. (සා.පෙළ ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයය 05ක් එකවර සමත් විය යුතු ය.) |

02. *පළපුරුද්ද* :- පළාත් පාලන ආයතනය ප්‍රාථමික තනතුරුවල සේවය කරන්නන්ට මේ සඳහා අයදුම් කල හැකි වන අතර තනතුරේ ස්ථිර කර තිබිය යුතු ය. ඉල්ලුම්කරන දිනට වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම කාලය තුළ කිසිදු විනය දඬුවමකට ලක් වූ අයෙකු නොවිය යුතුය. සේවා කාලය ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් තහවුරු කල යුතු ය.

03. *කායික සුදුසුකම්* :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

04. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම්* :-

*(i)* අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
*(ii)* අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය.

*(iii)* අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.

*(iv)* අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

*(v)* දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් හා දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

*(vi)* දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වයස් සීමාවන් අදාළ නොවේ.

*05. බඳවා ගැනීමේ ක්‍රමය :*

ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම (ප්‍රශ්න කිහිපයකට වාචිකව පිළිතුරු ලබාදීම)

කසළ කළමනාකරණය පිළිබඳ ලබා ඇති පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී තිබීම (අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.)

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බැලේ.

*06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

*(i)* අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2014.06.16 හෝ එදිනට පෙර ලේකම් ප්‍රාදේශීය සභාව අගලවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*(ii)* අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර "................................................ තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුය.

*(iii)* අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය ;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය; (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
*(ඊ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 19 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාව,
අගලවත්ත.

***ආදර්ශ අයදුම්පත්‍රය***

*අගලවත්ත ප්‍රාදේශීය සභාව*

***අගලවත්ත ප්‍රාදේශීය සභාවේ .......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.

05. දිස්ත්‍රික්කය :——————.

06. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2014.06.16) දිනට වයස: අවුරුදු :——————. මාස:——————. දින:——————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ———————.

09. විවාහක ද/ අවිවාහක ද යන වග :———————.

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :———————.

11. ජාතික හැඳුනුම්පත් අංකය :———————.

12. අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස (සා. පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය ඃ

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :———————.

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර : ———————.
එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ———————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

........................................................ මහතා/මහත්මිය මෙම ආයතනයේ .................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

06-169

---

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 1 | රියැදුරු | 02 | රු. 12,470 - -10 x 130-10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත්වී තිබිය යුතුය. පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියැදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රය සහ නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය. මෝටර් රථ රියැදුරන් රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය |
| 2 | පුස්තකාල සහායක | 01 | රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබිය යුතු ය |
| 3 | විදුලි කාර්මික | 01 | රු. 12,210 - 10 x 130-10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්වී තිබිය යුතු ය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම |
| 4 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 | රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | 8 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| 5 | සෞඛ්‍ය කම්කරු | 03 | රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | 8 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.
3. අයදුම්කරුවන් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වැරදිකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
6. සභාවේ දැනට ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

04.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2. පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද මෙම සභාවේ හෝ දකුණු පළාත් සභාව හෝ රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට යටත් වනු ඇත.

*බඳවා ගැනීමේ ක්‍රමය* ‍:

1. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
2. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

   (i) උප්පැන්න සහතිකය;
   (ii) අධ්‍යාපන සහතිකය;
   (iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුවේ.)
   (iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතු ය.)
   (v) වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* ‍:

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014 ජූනි 30 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සභාපති, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව, නව නගරය, ලුණුගම්වෙහෙර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමේ දී හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.

එච්. ජී. අනුර නිශාන්ත,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ .................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————————— .
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————— .
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————— .
4. ස්ථිර ලිපිනය :—————————— .
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————— .
6. විවාහක/අවිවාහක බව :—————————— .
7. (i) උපන් දිනය ‍: අවුරුද්ද :——————— . මාසය :——————— . දිනය:——————— .

   (ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ‍: අවු :—————— . මාස :—————— . දිනය:—————— .
8. ජාතික හැඳුනුම්පත් අංකය :—————————— .

9. ජාතිය:——————————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.

11. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වසර ගණන :——————————.

12. අධ්‍යාපන සුදුසුකම් :——————————.

13. පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම් :——————————.

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :——————————.

15. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත් පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

06-170

---

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| මාර්ග කම්කරු III ශ්‍රේණිය | 04 | රා.ප.ච. 06/2006 iv - පී. එල්. 1 2006 A රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් විය යුතු ය. |
| සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | රා. ප. ච. 06/2006 iv පී. එල්. I- 2006A - රු. 11,730-10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 -රු. 17,600 | රජය විසින් අනුමත කරන ලද පාසැලකින් 8 ශ්‍රේණිය සමත්වීම (9 වසර) |
| ජල කම්කරු III ශ්‍රේණිය | 01 | රා. ප. ච. 06/2006 iv - පී. එල්. 1 2006 A රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් විය යුතු ය. |

*02. පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
(iii) තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ).
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. (ඡන්දහිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතු ය).
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(vi) දැනටමත් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.
(viii) සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පුත්තලම් දිස්ත්‍රික්කය තුළ පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණයක් සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

*04. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නියමිත පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*05. අයදුම්පත් ඉදිරිපත් කිරීම .*

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍ර 2014.06.20 දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ආරච්චිකට්ටුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ඒ4 කඩදාසියක දෙපැත්ත භාවිත කර අයදුම්පත සැකසිය යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය :-

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. පාසලෙන් අස්වීමේ සහතිකය
04. පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
05. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.
06. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. පී. චන්දන කුමාර මයා,
ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව,
ආරච්චිකට්ටුව.

2014 මැයි මස 20 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් රාජ්‍ය සේවයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති .............................................. තනතුර සඳහා බඳවා ගැනීම - 2014***

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම : ——————.
(ii) මුලකුරු සමග නම: ——————.
02. ස්ථිර ලිපිනය: ——————.
03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: ——————.
04. ග්‍රාම නිලධාරි වසම හා අංකය: ——————.
05. උපන් දිනය : අවුරුද්ද: ——————, මාසය: ——————, දිනය: ——————.
06. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු: ——————, මාස: ——————, දින: ——————.
07. දුරකථන අංකය: ——————.
08. ස්ත්‍රී/පුරුෂභාවය: ——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය: ——————.
10. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය : වසර: ——————.
11. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග : ——————.

12. අධ්‍යාපන සුදුසුකම් : ——————.
විභාගයේ නම : ——————. වර්ෂය : ——————.

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

13. වෙනත් සුදුසුකම්: ——————.
14. වෘත්තීය සුදුසුකම්: ——————.
15. සේවා පළපුරුද්ද: ——————.

(i) දැනට සේවය කරන ආයතනයේ නම හා ලිපිනය: ——————.
(ii) දැනට දරන තනතුර හා ශ්‍රේණිය : ——————.
(iii) එම තනතුරට/ශ්‍රේණියට පත් වූ දිනය: ——————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර: ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන ..................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම: ——————.
පදවි නාමය: ——————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව තබන්න) : ——————.
දිනය : ——————.

06-88

## කඩුවෙල මහ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කඩුවෙල මහ නගර සභාවේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පලාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවස්ථාව ලැබෙන තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය(මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II "ආ" වන පන්තිය | 10 | රු.12,470- 10 x130 - 10 x 145 -10 x 160- 12 x 170- රු.18,860 PL 3-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය)<br>ii. පෞද්ගලික කුලී රථ සහ භාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>iii. වාහන රියැදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)<br>iv. අවම උස අඩි 05 ක් විය යුතු ය.<br>v. දිවා සහ රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>vi. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු ය.<br>vii. පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සහ මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් බඳවාගනු ලැබේ. |
| 02. | ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 01 | රු.12,210 - 10 x130 - 10 x145 10 x160 - 12x170 - රු.18,860 PL 2-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>(අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම, සහ<br>(ආ) අවම වශයෙන් වසර 02 ක සේවා පලපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)<br>(ii) *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී,<br>*හෝ*<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම.<br>*සහ*<br>(ඇ) අවම වශයෙන් වසර 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබිම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය(මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 -17,600 PL 1-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |
| 04. | ක්ෂේත්‍ර කම්කරු | 01 | 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 -17,600 PL 1-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය (6 වසර) සමත්වී තිබීම. |
| 05. | සෞඛ්‍ය කම්කරු | 20 | 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 -17,600 PL 1-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

(ආ) දැනටමත් කඩුවෙල මහා නගර සභාවේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි තනතුරු

| *අනු . අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය(මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය | 01 | 13,120- 10 x145 - 11 x 170 -10 x 240- 10x 320- 22,040 MN 1-2006A හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | (i) *අධ්‍යාපන සුදුසුකම් :-* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත්වී තිබිය යුතුයි.)<br>(ii) *පළපුරුද්ද :* පළාත් පාලන ආයතනයක PL 1 හා PL 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05)ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.<br>(iii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>(iv) *ලිඛිත විභාගය :* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රය හා ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කෙරෙන පැය 1ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |
| 02. | පුස්තකාල සහායක | 01 | 11,730 - 10 x 130 - 10 x 130 - 10 x 145 -12 x 160 -17,600 PL 1-2006A (12 වන පියවර) හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් :* දැනටමත් කඩුවෙල මහා නගර සභාවේ කාර්යාල සේවක සේවයේ ස්ථිර සේවයේ නියුතු සේවකයන්ට පමණි.<br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී එක් වරකදී හෝ විෂයයන් 06ක් සමත් විය යුතුය. |

| අනු . අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමානය(මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *සේවා පළපුරුද්ද*<br><br>(අ) කාර්යාල සේවක සේවයේ තනතුරක III වන පන්තියේ/ශ්‍රේණියේ තනතුර ස්ථිර කර තිබීම.<br><br>(ආ) කාර්යාල සේවක සේවයේ තනතුරක III වන පන්තියේ/ශ්‍රේණියේ වසර 6ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.<br><br>(ඇ) කාර්යාල සේවක සේවයේ III වන පන්තියට/ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර තිබීම.<br><br>(ඈ) උසස්වීම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම. |
| 03. | කාර්යාල කාර්ය සහායක | 13 | 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 -17,600 PL 1-2006A (12 වැනි පියවර) හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br><br>දැනටමත් කඩුවෙල මහා නගර සභාවේ කාර්යාල සේවක සේවයේ ස්ථිර සේවයේ නියුතු සේවකයන්ට පමණි.<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතු ය.<br><br>*සේවා පළපුරුද්ද*<br><br>(අ) කාර්යාල සේවක සේවයේ තනතුරක III වන පන්තියේ/ශ්‍රේණියේ තනතුර ස්ථිර කර තිබීම.<br><br>(ආ) කාර්යාල සේවක සේවයේ තනතුරක III වන පන්තියේ/ශ්‍රේණියේ වසර 6ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.<br><br>(ඇ) කාර්යාල සේවක සේවයේ III වන පන්තියට/ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර තිබීම.<br><br>(ඈ) උසස්වීම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ත් 45ත් අතර විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ. )
(iv) යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත අයෙකු විය යුතු ය.
(v) ඉහත පළමුවන ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(vi) බඳවා ගැනීමේ පරිපාටියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(vii) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ වෙනස් කිරීමට හෝ මේ නිවේදනය සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීම හෝ කඩුවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කරනු ලැබිය හැකිය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) බඳවා ගනු ලබන තැනැත්තන් වසර තුන (03)ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

(iv) මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන නියමයන් සහ කඩුවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කළ පනවනු ලබන නියමයන්ට යටත් විය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව, 8.27" x 11.69" (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක (අංක 11 දක්වා එක් පැත්තක ද අංක 12 සිට ඉදිරියට අනෙක් පැත්තේ ද වන සේ කඩදාසිය දෙපැත්තේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2014 ජූලි මස 04 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ " නාගරික කොමසාරිස්, කඩුවෙල මහ නගර සභාව, කඩුවෙල. " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය. තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායාස්ථික පිටපත් අමුණා එවිය යුතු ය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතික,

*(ඇ)* පළපුරුද්ද පිළිබඳ සහතික,

*(ඈ)* මෑත දී ලබාගත් චරිත සහතික දෙකක්.

*(ඉ)* ජාතික හැඳුනුම් පත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථික පිටපත,

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය. (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස දෙකකට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු ය.)

*පුරප්පාඩු සඳහා තෝරා ගන්නා ක්‍රමය :*

(i) ඉහත සඳහන් තනතුරු අතරින් ලිඛිත පරීක්ෂණයක් හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍යවන තනතුරු සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතික අනුව අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කළ බවට සඳහන් වී ඇති තැනැත්තන් ප්‍රථමයෙන් අදාළ පරිදි ලිඛිත පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ඇත.

(ii) ලිඛිත පරීක්ෂණයෙන් හෝ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගෙන ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතිකවල මුල්පිටපත් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සම්පූර්ණ කළ බවට තහවුරු කරගත් අපේක්ෂකයන් අතරින් පුරප්පාඩු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

(iii) ලිඛිත පරීක්ෂණයකට හෝ ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය නොවන තනතුරු සඳහා අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතික අනුව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ බවට සඳහන් වී ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ අය අතරින් පුරප්පාඩු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

(iv) කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න කඩුවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(v) කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

(vi) මේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්ට හෝ වෙනත් කවර හෝ තැනැත්තෙකුට විශේෂයෙන් කිසියම් බලපෑමක් කිරීම අපේක්ෂකත්වය අවලංගු වීමක් සේ සලකනු ඇත.

(vii) මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය කඩුවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

ගාමිණී ගුණසේකර,
නාගරික කොමසාරිස්.
කඩුවෙල මහ නගර සභාව.

2014 මැයි මස 16 වැනි දින,
කඩුවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ කඩුවෙල මහ නගර සභාවේ ................................................ තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය**

01. මුලකුරු සමග නම : ——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම්: ——————.

02. ස්ථිර පදිංචිය ඇති : ——————.
දිස්ත්‍රික්කය : ——————. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ——————.
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය : ——————. නම : ——————.

03. ස්ථිර ලිපිනය : ——————.

04. ජාතික හැඳුනුම්පත් අංකය: ——————. දිනය : ——————.

05. උපන් දිනය ඃ අවුරුද්ද: —————— මාසය: —————— දිනය: ——————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————. විවාහක/අවිවාහක තත්ත්වය : ——————.

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස ඃ අවුරුදු: —————— මාස: —————— දින: ——————.

08. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය: අවුරුදු: —————— මාස: —————— දින: ——————.

09. ශ්‍රී ලංකා පුරවැසියකු ද නැත් ද යන වග: ——————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :
*(අ)* සමත් වූ වසර/ශ්‍රේණිය : ——————. වර්ෂය : ——————.
*(ආ)* අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ
පළමුවර - විභාග අංකය : ——————. වර්ෂය හා මාසය : ——————.
දෙවනවර - විභාග අංකය : ——————. වර්ෂය හා මාසය : ——————.

*සමත් වූ විෂයයන් ඃ*

| *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* | *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

*(ඇ)* අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ
විභාග අංකය : ——————. වර්ෂය හා මාසය : ——————.

*සමත් වූ විෂයයන් ඃ*

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෘත්තීය සුදුසුකම්(සහතික මගින් සනාථ කළ යුතු ය) : ——————.
12. සේවා පළපුරුද්ද: ——————.
 (i) දැනට සේවය කරන ආයතනය: ——————.
 (ii) දැනට දරන තනතුර : ——————.
 (iii) එම තනතුරට පත් වූ දිනය: ——————.
 (iv) ඊට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර: ——————.

13. ඔබ උසාවියකින් වරදකට වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.

14. මෙහි ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

ඉහත ඉල්ලුම්පත්‍රයේ සඳහන් ඉල්ලුම්කරු වන ...................................................................... මහත්මා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................ වශයෙන් සේවය කරයි. ඉහත තනතුරට තෝරා පත් කරගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව යොදන්න)

නම: ——————.
පදවි නාමය: ——————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ——————.
දිනය : ——————.

06-01

# පළාත් පාලන නිවේදන

## හැටන් - දික්ඔය නගර සභාව

හැටන් - දික්ඔය නගර සභාවේ 2014.03.20 දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 02:02 යටතේ ගන්නා ලද සභා තීරණය පරිදි හැටන්-දික්ඔය නගර සභාවට අයත් දිඹුල III පටුමගෙහි සාත්තු නිවාස පාරේ පිහිටි ඉඩම් කොටසෙහි ඉදි කරනු ලබන වන උයන "අලගමුත්තු විවේක උයන - Allagamuthu Recreation Park " වශයෙන් නම් කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි.

මෙකී ඉඩම් කොටස සඳහා බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන මහතා විසින් 1998 පෙබරවාරි මස 13 වැනි දින ඇඳ සකස්කර ඇති මානක සැලසුම් අංක 8555 හා L.R.C. අංක කො. 833 හි සඳහන් ලොට් අංක 01 දරන රූඩ් 01 පර්චස් 01.01 අයත් වන අතර මෙහි මායිම් පහත සඳහන් පරිදි වේ :-

උතුර - ලොට් අංක 01 පි. පී. මහ 718 සහ දිඹුල III වැනි පටුමග,
නැගෙනහිර - දිඹුල III පටුමග සහ හැටන් වත්ත,
දකුණ - හැටන් වත්ත සහ ඇල මාර්ගය,
බටහිර - ඇළ මාර්ගය සහ ලොට් අංක 01 හි පී.පී.මහ 718.

වෛද්‍ය අලගමුත්තු නන්දකුමාර්,
සභාපති.
හැටන් දික්ඔය නගර සභාව.

2014 මැයි මස 13 වැනි දින,
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

06-03

## බදුල්ල මහ නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2014.04.01 දින දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මෙම මාර්ගයට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 30ක් තුලදී තමාගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාවට දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුල දැනුම්දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොමැති සේ සළකා මෙම *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ලබන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල මහ නගර සභාව.

2014 මැයි මස 12 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

#### *උපලේඛනය*

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම්පස වරිපනම් අංක* | *දකුණුපස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | මැදපතන ගල්වල පාර | මැදපතන රවුම් පාර | ගල්වල | 87/2,87/3,87/5 | 87/14,87/16,87/08,87/10 87/8ඒ | 250 | 4.5 |

06-04

---

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාදේශීය සභාව වෙත සතු වී ඇති මංමාවත් පිළිබඳ දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21,22 සහ 23 වැනි වගන්ති මගින් සැලසී ඇති ප්‍රතිපාදන පරිදි සභා බල ප්‍රදේශය තුල පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට හා වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සහ එම ආයතන මගින් පාලනය වන්නාවූ මාර්ග හැර අන් සියලුම පොදු මාර්ග ආණමඩුව ප්‍රාදේශීය සභාව සතුවී ඇති ලෙසට සලකනු ලබන බවත්,

උක්ත පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය සභාව මගින් මැන සලකුණු කර අනුරේඛනය කර ඇති අංක 01 දරන උපලේඛනයේ සඳහන් මාර්ග ආණමඩුව ප්‍රාදේශීය සභාව සතු පොදු මාර්ග බවටත්, ප්‍රකාශයට පත් කිරීම සඳහා විරෝධතා කැඳවමින් ආණමඩුව ප්‍රාදේශීය සභාවේ සභාපති එච්. එම්. උදාර මධුසංඛ පෙරේරා වන මා විසින්, වර්ෂ 2014.01.10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1845 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) පළාත් පාලන කොටසේ පලකරවන්නට යෙදුණු නිවේදනයට අනුව කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් වී නැති හෙයින් ද, විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ කාලසීමාව 2014.04.10 දිනෙන් ඉක්මවා ඇති හෙයින් ද, ඉහත අංක 1845 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද පහත අංක (01) දරන උපලේඛනයේ සඳහන් මාර්ග මෙම *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත් කල දිනයේ සිට ආණමඩුව ප්‍රාදේශීය සභාව සතු පොදු මාර්ග ලෙසටත්, එම මාර්ගවල මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට අඩි 25ක් දක්වා කොටස ගොඩනැගිලි සීමා බල ප්‍රදේශය ලෙසටත් ක්‍රියාත්මක විය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

එච්. එම්. උදාර මධුසංඛ පෙරේරා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 13 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

#### *උපලේඛන අංක 01*

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසාන වන ස්ථානය* | *මාර්ගයේ දුර* |
|---|---|---|---|---|
| 01 | රණවිරු මහින්ද මාවත | පුත්තලම කුරුණෑගල පාරේ සිට | හලාවත පාර දක්වා | 630m |
| 02 | දර්ශනගම පාර | තානායම ළඟ සිට | ගම්උදාව දක්වා | 502m |
| 03 | වෙන්දේසිවත්ත පාර | හලාවත පාරේ සිට | කට්ටෑව පාර දක්වා | 466m |

06-103

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජූනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2014.08.01 | සිකුරාදා | 2014.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.08 | සිකුරාදා | 2014.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.15 | සිකුරාදා | 2014.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.22 | සිකුරාදා | 2014.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.29 | සිකුරාදා | 2014.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.